# ආදි බුදුදහමේ හා පශ්චාත් කාලීන බෞද්ධ දර්ශන සම්ප්‍රදායයන්හි එන පරමාර්ථ ධර්ම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්.


එච්.ඒ.කේ. නයනා කුමාරි ආරියරත්න

2010/Ph.D/S/1402

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

කැලණිය විශ්ව විද්‍යාලය


බෞද්ධ දර්ශනය පිළිබඳ දර්ශන විශාරද උපාධිය සඳහා කැලණිය විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය වෙත ඉදිරිපත් කරනු ලබන පර්යේෂණාත්මක නිබන්ධය.

2013

## සාරාංශය

බුදුරජාණන් වහන්සේගේ ධර්ම දේශනා සම්මුති හා පරමාර්ථ යන සත්‍යයද්වය උපයෝගී කරගෙන පවතින බව සාමාන්‍යය පිළිගැනීමයි. මෙයින් සම්මුති සත්‍යය යනු සත්ත්වයා හට ඉන්ද්‍රියගෝචරව පවතින ව්‍යවහාරික ලෝකයයි. එම ලෝකය විශ්ලේෂණය කළ හැකි අතර, එසේ විශ්ලේෂණය කිරීමෙන් පසු අවසාන වශයෙන් ඉතිරි වන තත්ත්වය පරමාර්ථ සත්‍යය මඟින් අවධාරණය කෙරේ. සත්ත්වයා ඇතුළු විශ්වයෙහි පරමාර්ථ තත්ත්වය පිළිබඳව විවිධ බෞද්ධ ගුරුකුලයන් විසින් මතවාද ගණනාවක්ම ඉදිරිපත් කරන ලදී.

ආදි බුදුදහම හෙවත් පාලි සූත්‍රපිටකය තුළ සම්මුති හා පරමාර්ථ සත්‍යය පිළිබඳව පැහැදිලිව සඳහන් නොවේ. එසේ වුවද පුද්ගලයා වෙත ඉන්ද්‍රියගෝචරව පවතින ලෝකයෙහි යථාස්වභාවය අවබෝධ කරදෙන විශ්ලේෂණාත්මක හා සංස්ලේෂණාත්මක ධර්ම කරුණු වන ස්කන්ධ, ධාතු, ආයතන විභාගයත්, ත්‍රිලක්ෂණ සිද්ධාන්තයත්, ඉදප්පච්චයතා න්‍යාය හා ශූන්‍යතාව පිළිබඳවත් කරුණු ඉගැන්වේ. නැවත වරක් පාලි අභිධර්මපිටකය තුළ ඉහත කී ධර්ම කරුණු තවදුරටත් විශ්ලේෂණය කර ඉදිරිපත් කර තිබේ.

සම්මුති හා පරමාර්ථ ධර්ම පිළිබඳව පැහැදිලිවම ඉගැන්වෙන්නේ නිකායාන්තර බුදු සමය තුළය. විශේෂයෙන්ම පාලි අභිධර්ම අටුවා ග්‍රන්ථවලත්, ධර්ම සංග්‍රහ ග්‍රන්ථවලත්, සර්වාස්තිවාදී හා සෞත්‍රාන්තික යන ථේරවාදී සම්ප්‍රදායයන් තුළත් සතර පරමාර්ථ ධර්ම සංකල්පයක් ඉදිරිපත් කෙරේ. මෙයින් ශ්‍රීලාංකික මහාවිහාර සම්ප්‍රදායයට අයත් රූපකලාප වාදයත් , සර්වාස්ති වාදීන්ගේ පරමාණුවාදයත් රූප හෙවත් ද්‍රව්‍ය ධර්මයන්ගේ යථාස්වභාවය ඉතා සියුම් අයුරින් විග්‍රහ කර තිබෙන ඉගැන්වීම් අතර ප්‍රමුඛ වේ.

සෞත්‍රාන්තිකයින්ගේ ක්ෂණභංගුරවාදය අනිත්‍යතා සිද්ධාන්තයේ මෙන්ම බෞද්ධ කාලවාදයේ ද සංවර්ධනීය අවස්ථාවකි.

මහායාන බෞද්ධ ගුරුකුල ලෙස සැලකෙන යෝගාචාර විඥානවාදීහු හා මාධ්‍යමිකයෝ ශූන්‍යතා සිද්ධාන්තය පිළිබඳව තාර්කානුකූලව ඉතා පුළුල් අයුරින් විග්‍රහ කරති. මේ අය අතරින් යෝගාචාර විඥානවාදීහු විඥප්තිමාත්‍රතා සිද්ධාන්තය පිළිබඳවත් , මාධ්‍යමික ශූන්‍යතා දර්ශනය මඟින් ශූන්‍යතා ප්‍රතිසංයුක්ත වු පටිච්චසමුප්පාද න්‍යාය පිළිබඳවත් කරුණු විග්‍රහ කර පෙන්වූහ.

පෙළ බුදුදහම මෙන්ම පශ්චාත්කාලීන බෞද්ධ දර්ශන සම්ප්‍රදායයන්වල පරමාර්ථ ධර්ම සම්බන්ධයෙන් ඉගැන්වෙන ඉහත කී කරුණු පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු මෙම නිබන්ධයෙහි අන්තර්ගත වේ.